# නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී - ක්‍රෙඩිට් කාඩ්පත් පිළිබඳ මූලික කරුණු අන්තර්ගත ලේඛනය

හිතවත් ගනුදෙනුකාර භවතුන් වෙත,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ගනුදෙනුකාර ප්‍රඥප්තිය යටතේ ඇති අවශ්‍යතාවයකට අනුව, අප විසින් පිරිනමනු ලබන බැංකුකරණ නිපැයුම්/සේවාවන් අතරින් ඔබට අවශ්‍ය වන සහ ඔබට යෝග්‍ය වන නිපැයුම්/සේවාවන් තෝරා ගැනීමට උපකාර කිරීම සඳහා අප විසින් මූලික කරුණු අන්තර්ගත වන ලේඛන මාලාවක් සකස් කර ඇත.
මෙම මූලික කරුණු අන්තර්ගත වන ලේඛන මාලාව මඟින් නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී වෙතින් ලබා ගත හැකි ක්‍රෙඩිට් කාඩ් නිපැයුම් සහ සේවාවන් පිළිබඳ පුළුල් ආකෘතියක් ඔබට ලබා දේ. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සඳහන් ආකාරයට අප හා සම්බන්ධ වන්න.

දුරකථන :කරුණාකර පැය 24 පුරා ක්‍රියාත්මක වන අපගේ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංක ඔස්සේ අප අමතන්න -ඇමරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා: (011)4414141/ මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා:(011)4414155
විද්‍යුත් තැපෑල :ඇමරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා:americanexpress@nationstrust.com/ මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා: creditcards@nationstrust.com
වෙබ් අඩවිය :www.nationstrust.com/ ඇමරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා පමණි: www.americanexpress.lk
ලිපි :කළමනාකරු- සේවා ගුණාත්මකතා
නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී -PQ118, ක්‍රෙඩිට් කාඩ් මධ්‍යස්ථානය, 256, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ15

ඔබට ක්‍රෙඩිට් කාඩ්පත් සම්බන්ධයෙන් කිසියම් පැමිණිල්ලක් ඇත්නම්, කරුණාකර පැමිණිල්ල පිළිබඳ දැන්වීමක් ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් ඉහත ලිපිනයට යොමු කරන්න, නැතහොත් ඉහත සඳහන් දුරකථන අංක ඔස්සේ අප හා සම්බන්ධ වන්න, එම අවස්ථාවේදී අපි ඔබට කාර්යාල දින 3ක් ඇතුලත ප්‍රතිචාර දක්වන්නෙමු. පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය - https://www.nationstrust.com/we-value-your-feedback හි දක්වා ඇත

**විස්තරය: ක්‍රෙඩිට් කාඩ්පත් (ණයවර කාඩ්පත්)**
**ක්‍රෙඩිට් කාඩ්පතක් යනු කුමක්ද?**
ක්‍රෙඩිට් කාඩ්පතක් යනු ගෙවීමේ ක්‍රමයක් ලෙස යොදා ගැනීම සඳහා පරිශීලකයන්ට නිකුත් කරනු ලබන ප්ලාස්ටික් කාඩ්පතකි. මෙය කාඩ්පත දරන්නාට භාණ්ඩ සහ සේවා සඳහා පසු දිනකදී මුදල් ගෙවීමේ පොරොන්දුව මත පදනම්ව එම භාණ්ඩ සහ සේවා (ණයට) මිලදී ගැනීමට ඉඩ සලසයි. එක් එක් කාඩ්පතේ ණය ගැනීමේ සීමාව බැංකුව විසින් කලින් නියම කරනු ලබයි. ගනුදෙනුකරුට සම්පූර්ණ ණයෙන් එහි අවම නියමිත මුදල හෝ සම්පූර්ණ මුදල ගෙවීම යන විකල්පයන්ගෙන් එකක් තෝරා ගැනීමේ හැකියාව ඇත. ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා හීන වන ශේෂ ක්‍රමය යටතේ පොලිය අය කරනු ලබයි.

**පරිපූරක ක්‍රෙඩිට් කාඩ්පත්**
පරිපූරක කාඩ්පත් නිකුත් කරනු ලබන්නේ මූලික කාඩ්පත් සාමාජිකයා විසින් නිර්දේශ කරනු ලබන ආසන්නතම පවුලේ සාමාජිකයින් සහ පුද්ගලයන් සඳහා පමණක් වන අතර මූලික කාඩ්පතේ ණය සීමාව පරිපූරක කාඩ්පත් අතරද බෙදී සහ එම ණය සීමාව හවුලේ බුක්ති විඳිනු ඇත. කාඩ්පත මගින් සිදු කරන සියලුම ගනුදෙනු/ අය කරන ගාස්තු සඳහා මූලික සහ පරිපූරක කාඩ්පත් සාමාජිකයින් ඒකාබද්ධව සහ තනි තනිව වගකිව යුතු වේ.
පරිපූරක කාඩ්පත් වලට අදාළ ඕනෑම ක්‍රියාවක් මූලික කාඩ්පත් සාමාජිකයාගේ ඉල්ලීම මත පමණක් සිදු කරනු ලැබේ.

**ඇමරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත් යටතේ ඇති නිපැයුම් මාලාව**
ඇමරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා – www.americanexpress.lk

**මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත් යටතේ ඇති නිපැයුම් මාලාව**
මාස්ටර්කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා – www.nationstrust.com

**දිරි දීමනා/ප්‍රවර්ධන ඇතුළුව ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ**
■ ණය පදනම මත ලොව පුරා භාණ්ඩ හා සේවාවන් මිලදී ගැනීම.
■ ක්‍රෙඩිට් කාඩ්පතක් භාවිතයෙන් මුදල් අත්තිකාරම් ලබා ගැනීමේ හැකියාව.
■ පැය 24 පුරා ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානය සහ හදිසි අවස්ථා සහාය.
ඩිජිටල් චැනල් සේවාව - ජංගම බැංකකරණ සේවාව/ මාර්ගගත බැංකකරණ සේවාව/ කෙටි පණිවුඩ සේවාව / විද්‍යුත් ප්‍රකාශය
■ අන්තර්ජාලය ඔස්සේ ක්‍රෙඩිට් කාඩ් බිල්පත් පියවීමේ හැකියාව.
■ තෝරාගත් වෙළෙන්දන්ගෙන් 0% වාරික සැලසුම් අවස්ථා
■ ඇමරිකන් එක්ස්ප්‍රස් ආයතනික කාඩ්පත් හැර අනෙක් සියලුම කාඩ්පත් සඳහා ප්‍රසාද ළකුණු පිරිනැමීමේ සැළසුම් (නිපැයුම අනුව පිරිනමන සැළසුම් වෙනස් විය හැක)

**ගනුදෙනුකරුවන්ගෙන් ණය කාලසීමාව තුල අය කර ගනු ලබන ගාස්තු/අය කිරීම්/ කොමිස්/පොළි සහ පොළි අය කිරීම්**
කාඩ්පත උපයෝගී කර ගනිමින් සිදු කරන ලද මිලදී ගැනීම් සඳහා කාඩ්පත් සාමාජිකයෙකුට හිමියෙකුට අවම දින 20ක සහ උපරිම දින 50ක ණය කාලයක් භුක්ති විඳිය හැකි වේ.

කාඩ්පත් හිමියා නියමිත දිනට හෝ ඊට පෙර සම්පූර්ණ හිඟ මුදල ගෙවන්නේ නම්, එම කාලසීමාව සඳහා එම කාඩ්පත් ගිණුමට කිසිදු පොළියක් අය නොකෙරෙනු ඇත.

හිඟ මුදලින් අවම ගෙවීම හෝ කොටසක් ගෙවීම පමණක් සිදු කරන්නේ නම්, පොලී අය කෙරෙනු ඇත.

පොලිය ගණනය කිරීම සඳහා භාවිතා කරන සූත්‍රය
ගණනය = ප්‍රාග්ධන මුදල × පොලී අනුපාතය × (දින ගණන/365)

හීන වන ශේෂ ක්‍රමය මත දිනපතා පොලිය ගණනය කෙරේ.

ප්‍රකාශයේ "ගිණුම්ගත දිනය" යටතේ දක්වා ඇති දිනය එක් එක් ගනුදෙනුවේ පොලිය ගණනය කිරීමේ ආරම්භක දිනය ලෙස සලකනු ලැබේ.

**කාඩ්පත් ගාස්තු**
* සම්බන්ධ වීමේ ගාස්තු - එක් වරක් පමණක් ගෙවනු ලබන ගාස්තුවකි.
* වාර්ෂික ගාස්තුව - වාර්ෂිකව අය කෙරේ.

**දඩ ගාස්තු**
* ණය සීමාව ඉක්මවීමේ ගාස්තුව - අවසර දී ඇති ණය සීමාව ඉක්මවා ඇත්නම් අය කෙරේ.
* ප්‍රමාද වී ගෙවීමේ ගාස්තුව - නියමිත දිනට හෝ ඊට පෙර අවම ගෙවීම සිදු නොකළේ නම් අය කෙරේ.

**මූල්‍ය ගාස්තු**
*මුදල් අත්තිකාරම් ගාස්තුව - මුදල් ආපසු ගැනීමේදී අය කෙරේ.

බලාත්මක වන සියලුම රජයේ ගාස්තු (මුද්දර ගාස්තු ඇතුළුව) අදාළ වන පරිදි අය කෙරේ.

**අනෙකුත් ගාස්තු**
කාඩ්පත සඳහා අදාළ වන සියළු අනෙකුත් ගාස්තු සම්බන්ධයෙන් සම්පූර්ණ ලැයිස්තුව සඳහා කරුණාකර පහත වෙබ් අඩවි යටතේ දැක්වෙන කාඩ්පත් ගාස්තු සඳහා යොමු වන්න

* ඇමරිකන් එක්ස්ප්‍රස් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා - www.americanexpress.lk

*මාස්ටර් කාඩ් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා - www.nationstrust.com

**නිපැයුම/සේවාව ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය**
අවශ්‍ය සුදුසුකම් සහ ලිපිලේඛන
අවම වශයෙන් වයස අවුරුදු 18 ක් විය යුතුය.

**රැකියාවක නිරත වන්නේ නම්**
■ ක්‍රෙඩිට් කාඩ් ඩිජිටල් අයදුම් පත්‍රය
■ජාතික හැඳුනුම්පතේ / විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්
■ වැටුප් පත්‍රිකාව
■ වැටුප තහවුරු කරමින් සේවායෝජකයාගේ ලිපිය
■ බිල්පත් සාක්ෂි (එනම් දුරකථන බිල්පත, ජල බිල්පත හෝ විදුලි බිල්පත)

**ස්වයං රැකියාවක් කරන්නේ නම්**
■ ක්‍රෙඩිට් කාඩ් ඩිජිටල් අයදුම් පත්‍රය
■ ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්
■ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය / Form 20 (සීමිත වගකීම් සමාගමක් වන්නේ නම්)
■ පසුගිය වසර 2 සඳහා බදු වාර්තා
■ පසුගිය වසර 2ක වාර්ෂික ආදායම තහවුරු කරමින් විගණක වෙතින් ලිපියක්
■ පසුගිය මාස 3 සඳහා බැංකු ප්‍රකාශන (සමාගමේ සහ පුද්ගලික යන දෙකෙන්ම)
■ වෙනත් ආදායම් පිළිබඳ සාක්ෂි (අදාළ වන්නේ නම්)
■ බිල්පත් සාක්ෂි (එනම් දුරකථන බිල්පත, ජල බිල්පත හෝ විදුලි බිල්පත)

ක්‍රෙඩිට් කාඩ්පත් භාවිතය පිළිබඳ නියමයන් සහ කොන්දේසි දක්වන ලිඛිත ගිවිසුමකට ද ගනුදෙනුකරු බැංකුව සමඟ එළඹිය යුතු වේ.

**කාර්ය පටිපාටිය**

නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ඕනෑම ශාඛාවක් හරහා ක්‍රෙඩිට් කාඩ්පත් අයදුම් කළ හැක
හෝ
එලෙසම ඔබට- Digital Self on-boarding – https://direct2you.nationstrust.com/
හරහා මාර්ගගතව ස්වයං අයදුම් කළ හැකිය.

**ප්‍රධාන නියමයන් සහ කොන්දේසි**
නියමයන් සහ කොන්දේසි තුළ පහත සඳහන් කරුණු අනෙකුත් කරුණු සමඟ ද ඇතුළත් වේ.

**කාඩ්පත භාවිතා කිරීම**
මෙම කාඩ්පත ලොව පුරා වලංගු වේ; කෙසේ වුව ද, කාඩ්පත් හිමියා වාණිජ / ව්‍යාපාරික අරමුණු සඳහා කාඩ්පත භාවිතා නොකළ යුතුය. එය පුද්ගලික අවශ්‍යතා සඳහා පමණක් භාවිතා කළ යුතු වේ. කාඩ්පත් හිමියා සෑම විටම ඔහුගේ PIN අංකය රහසිගතව මෙන්ම කාඩ්පතෙන් වෙන්ව තබා ගත යුතු වේ. අස්ථානගතවීමක් හෝ සොරකම් කරනු ලැබීමක් පිළිබඳව බැංකුවේ ශ්‍රී ලංකාවේ කාඩ්පත් මධ්‍යස්ථානයට දැනුම් දෙන තුරු කාඩ්පත භාවිතයෙන් සිදු වන සියලුම ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු වේ.

**මුදල් අත්තිකාරම්**
කාඩ්පත් සාමාජිකයාට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවලින් (ATM) හෝ බැංකු ශාඛා හෝ මුදල් ලබා දෙන වෙළෙන්දන් (යන්ත්‍ර/නියෝජිතයින්) හෝ ඩිජිටල් නාලිකා සේවා. හරහා ක්‍රෙඩිට් කාඩ්පතේ පවරා ඇති මුදල් සීමාව දක්වා මුදල් අත්තිකාරම් ලබා ගත හැක. සියලුම දේශීය/රටේ සීමාවන් සහ එක් එක් මාදිලියේ සීමාවන් අදාළ වනු ඇත.

**ණය සීමාව**
කාඩ්පත් හිමියාගේ ගිණුමට අදාළ වන ණය සීමාව ඔහුගේ ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශයේ හෝ ඩිජිටල් යෙදුම් මත දැක ගත හැක

**ගෙවීම්**
කාඩ්පත් හිමියා අවම වශයෙන් ප්‍රකාශයේ සඳහන් වන "ගෙවිය යුතු සම්පූර්ණ අවම ගෙවීම් මුදල" බැංකුවට ගෙවිය යුතුය.

සෑම පරිපූරක කාඩ්පත් හිමියෙකු ම මූලික කාඩ්පත් හිමියා සමඟ ඒකාබද්ධව හෝ තනි තනි ව බැංකුවට මුදල් ගෙවීමට ද බැඳී සිටී. ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රකාශයේ පසුපිටෙහි ගෙවීම් ක්‍රම දක්වා ඇත.

**ණය අයකරවා ගැනීම**
ක්‍රෙඩිට් කාඩ්පතේ ගෙවිය යුතු හිඟ මුදල දින 30ක් කල් ඉකුත් වී ඇත්නම්, එම හිඟ මුදල ගෙවන තෙක් කාඩ්පත ගනුදෙනු සඳහා අවහිර කරනු ලැබේ.
ගෙවීම පැහැර හරින මුල් මාස 3 දී, ගෙවීම් අයකර ගැනීම සඳහා ලිපි, දුරකථන ඇමතුම්, කෙටි පණිවිඩ සහ අවශ්‍ය වන්නේ නම් ගනුදෙනුකරු හමු වී ගෙවීම් කරන ලෙස මතක් කිරීම් කරනු ලැබේ. බැංකුව ගනුදෙනුකරු හා සම්බන්ධ වීමට අපොහොසත් වුවහොත් තීරකයන් සම්බන්ධ කර ගනු ඇත. තවද බැංකුව සමඟ පවත්වාගෙන යනු ලබන ඕනෑම ගනුදෙනුකාර ගිණුමක් හර කිරීම මගින් බැංකුවට කල් ඉකුත් වූ හිඟ මුදල් ආපසු අයකර ගත හැක.

ඉහත ප්‍රයත්නයන් අසාර්ථක වූ විට, සිව්වන මාසයේ දී, බැංකුව විසින් හිඟ මුදල් අයකර ගැනීම සඳහා කොන්ත්‍රාත් පදනම මත පත් කරන ලද බාහිර ණය එකතු කිරීමේ ආයතන වෙත ගිණුම භාර දිය හැකිය. තව ද බැංකුව එහි අයිතිවාසිකම් ප්‍රකාරව කාඩ්පත් හිමියාට සහ සියලුම පරිපූරක කාඩ්පත් හිමියන්ට (සිටින්නේ නම්) එරෙහිව ප්‍රමාද වූ හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කළ හැක.

පාලන රෙගුලාසිවලට අනුව, සියලුම මූල්‍ය ආයතන වෙත යොමු කිරීම සඳහා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයට (CRIB) ක්‍රෙඩිට් කාඩ්පත් හි ණය සහ ගෙවුම් හිඟ මුදල් වරින් වර වාර්තා කරනු ලැබේ.

- මෙහි අඩංගු නිශ්චිත නියම සහ කොන්දේසි වලට අමතරව, ක්‍රෙඩිට් කාඩ්පතට අදාළ වන සියලුම සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි සහ පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf. හි සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි වල දක්වා ඇත.

- ගනුදෙනුකරුවන්ගෙන් අය කරන ගාස්තු/අය කිරීම්/කොමිස්/පොළිය සහ කලින් කලට වෙනස් විය හැකි අනෙකුත් අදාළ ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ පළ කර ඇත.

- මෙහි ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ ලේඛනයන්හි පාඨ අතර කිසියම් නොගැළපීමක් ඇති වුවහොත්, ඉංග්‍රීසි ලේඛනයෙහි පාඨ බලපැවැත්වේ.